# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,042 - 2017 ඔක්තෝබර් මස 20 වැනි සිකුරාද - 2017.10.20**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## (IVආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| තනතුරු- ඇබෑර්තු .... ... ... | 1890 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... | 1896 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... | — |
| පළාත් පාලන සහා ඡන්ද ආඥානත යටතේ දැන්වීම් .. | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | 1899 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2017 නොවැම්බර් මස 10 වැනි දින පළ කරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2017 ඔක්තෝබර් මස 27 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති (වැ. බ.)

2017 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම ගැසට් පත්‍රය *www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.


1889 - B 81219— 5,568 (2017/10)
F 1 -

# තනතුරු - ඇබෑර්තු

## නාඋල ප්‍රාදේශීය සභාව

නාඋල ප්‍රාදේශීය සභාවේ පහත සඳහන් කර ඇති සෞඛ්‍ය කම්කරු III වන පන්තියේ පුරප්පාඩු සඳහා බඳවා ගැනීමට සුදුසුකම් ඇති මධ්‍යම පළාතේ නාඋල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| අනු අංකය | තනතුරු නාමය | තනතුරු සංඛ්‍යාව | මාසික වැටුප් පරිමාණය | අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් |
|---|---|---|---|---|
| 01 | සෞඛ්‍ය කම්කරු III | 03 | රා.ප.ච. 03/2016(II) අනුව PL1 - 2016 රු. 24,250-10x250-10x270-10x300-12x330- රු. 36,410 | අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් විෂයයන් 02 කට සම්මාන සහිතව විෂයයන් 06 ක් සමත්ව තිබීම මින් විෂයයන් 05 ක් එක් වරකදී සමත් වී තිබිය යුතුයි.<br>හෝ<br>ඉහත සඳහන් සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් ඉදිරිපත් වී නොමැති අවස්ථාවලදී අවම සුදුසුකම 5 ශ්‍රේණිය සමත් වී තිබීම ලෙස සලකනු ලැබේ. |

01. *පොදු සුදුසුකම්* :-

(i) අයදුම්කරු ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතු අතර විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

(ii) අයදුම්පත් කැඳවන දින වන විට පූර්වාසන්න වසර තුනක කාලයක් නාඋල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය.

(iii) සෑම අපේක්ෂකයෙකුම මනා ඇස් පෙනීමක් සහ ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් හා යහපත් චරිතයකින් යුක්ත විය යුතුය.

(iv) අයදුම්කරු දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියේ වරදකරුවෙකු වී ඇති දඬුවම් ලැබූවෙකු නොවිය යුතුය.

(v) අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ 45 ට නොවැඩි විය යුතුය.

(vi) නාඋල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළින් පවත්නා පුරප්පාඩු සංඛ්‍යාවට සමානව සුදුස්සන් තෝරා ගැනීමට නොහැකි වූ විටක යාබද පළාත් පාලන ආයතන බල ප්‍රදේශයේ පදිංචිකරුවන්ගෙන් සුදුස්සන් තෝරා ගනු ලැබේ.

ඉහත සඳහන් සියලුම තොරතුරු සඳහා බඳවා ගැනීම් නාඋල ප්‍රාදේශීය සභාවේ ලේකම් විසින් සිදුකරනු ලැබේ.

02. *සේවයේ නියුක්තකරවීමේ කොන්දේසි* :

(i) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු අනත්දරු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයකට දායක මුදල් ගෙවිය යුතුය.

(ii) බඳවා ගනු ලබන සේවකයින් තුන් අවුරුදු පරිවාස කාලයකට යටත් වේ.

(iii) මෙම බඳවා ගැනීමේ කොන්දේසි වලට අමතරව ආයතන සංග්‍රහයේ කොන්දේසි වලට, පළාත් සභාවේ මුදල් රෙගුලාසි වලට, ගරු ආණ්ඩුකාරතුමියගේ නියෝග වලටද, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව කලින් කලට පනවනු ලබන වෙනත් කොන්දේසි හෝ රෙගුලාසි වලටද, පළාත් පාලන ආයතනයට අදාල ආඥා පනත්/පනත් වල විධි විධාන වලටද, නාඋල ප්‍රාදේශීය සභාව විසින් වරින් වර නිකුත් කරන ලද/ලබන නියෝග වලටද අනුකූලව කටයුතු කිරීමට එකඟ විය යුතුය.

03. මෙම නිවේදනය අවසානයේ දක්වා ඇති ආදර්ශ ආකෘතිය 12"x 8" ප්‍රමාණයේ කඩදාසියක සකස් කර අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය වන 2017.11.14 ලේකම්, නාඋල ප්‍රාදේශීය සභාව, නාඋල යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

අයදුම්පත් බහාලන කවරයේ වම් පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරන තනතුර සඳහන් කළ යුතුය. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් සහ අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

04. අයදුම්පත සමග පහත සහතිකවල පිටපත් ඇමිණිය යුතු අතර, මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතුය.

(i) උප්පැන්න සහතිකය,
(ii) අධ්‍යාපන සහතිකය,
(iii) පදිංචිය සහතික කිරීම පිණිස මෑතකදී ලබා ගත් ග්‍රාම නිලධාරී සහතිකය (ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කළ),
(iv) මෑතකදී ලබා ගත් චරිත සහතික 02 ක්,
(v) අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා ජාතික හැඳුනුම්පතේ පිටපතක්.

*සැ. යු.* මෙම *ගැසට්* නිවේදනය සංශෝධනය කිරීම හෝ කල් දැමීම හෝ අවලංගු කිරීම යන සියලු බලතල නාඋල ප්‍රාදේශීය සභාවේ ලේකම් සතු වේ.

ජී. එච්. එම්. උපුල් ප්‍රියදර්ශන,
ලේකම්,
ප්‍රාදේශීය සභාව,
නාඋල.

ආදර්ශ අයදුම්පත්‍රය

**මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ සෞඛ්‍ය කම්කරු III පන්තියේ තනතුර සඳහා අයදුම් පත්‍රය**

01. අයදුම්කරුගේ නම (මුලකුරු සමඟ) :————————————.
02. මුලකුරු වලින් හැඳින්වෙන නම් :————————————.
03. ස්ථිර ලිපිනය :————————————.
04. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :————————————.
05. දුරකථන අංකය :————————————.
06. නාඋල ප්‍රාදේශීය බල ප්‍රදේශයේ ස්ථිර පදිංචි කාලය :————————————.
07. උපන් දිනය : වර්ෂය :———— මාසය :———— දිනය :————
08. ජාතික හැඳුනුම්පත් අංකය :————————————
09. 2017.10.01 දිනට වයස අවුරුදු :————
10. ස්ත්‍රී/පුරුෂ භාවය :————————————
11. විවාහක / අවිවාහක බව :————————————
12. ජාතිය :————————————
13. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක් ද? එසේ නම් පරම්පරාවෙන් ද? ලියාපදිංචි වීමෙන් ද? යන වග :————————————
14. අධ්‍යාපන සුදුසුකම් :-

අ.පො.ස. සාමාන්‍ය පෙළ :

| *විෂයය* | *සාමාර්ථය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

අ.පො.ස උසස් පෙළ :

| *විෂයය* | *සාමාර්ථය* |
|---|---|
| | |
| | |
| | |
| | |

15. *පළපුරුද්ද හා වෘත්තීය සුදුසුකම්* :

මෙම අයදුම්පතෙහි මා විසින් සපයන ලද තොරතුරු සත්‍යවූත් හා නිවැරදිවූත් ඒවා බව මම මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු කිසිවක් අසත්‍ය හෝ වැරදි බව මෙම තනතුරු තෝරා ගැනීමට පෙර අනාවරනය වුවහොත් මා නුසුදුස්සෙකු වන බවත් පත්වීම් ලැබීමෙන් පසු එවැනි කරුණක් ඔප්පු වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බවත් දනිමි.

..........................................
අයදුම්කරුගේ අත්සන.

දිනය :............................................

10-657

---

## උකුවෙල ප්‍රාදේශීය සභාව

### මධ්‍යම පළාත් සභා රාජ්‍ය සේවයේ උකුවෙල ප්‍රාදේශීය සභාවේ රියදුරු තනතුරු සඳහා බඳවා ගැනීම

මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ උකුවෙල ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති රියදුරු තනතුරු සඳහා බඳවා ගැනීම සඳහා මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති උකුවෙල ප්‍රාදේශීය සභා සීමාව තුළ ස්ථිර පදිංචිය ඇති අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. (උකුවෙල ප්‍රාදේශීය සභාවේ දැනටමත් සේවයේ නියුතු ස්ථිර, අනියම්, ආදේශක සේවකයින්ට ප්‍රමුඛතාවය දක්වනු ලැබේ.)

### උපලේඛනය

| *තනතුරු නාමය* | *පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව* | *වැටුප් ක්‍රමය* | *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්* |
|---|---|---|---|
| රියදුරු | 02 | වැටුප් කේත අංකය PL-3 රා.ප.ච. 3/2016 අනුව වැටුප රු. 25,790-10x270-10x300-10x330-12x350- රු 38,990/= රා.ප.ච. 3/2016 හි උපලේඛන II පරිදි වැටුප් ගෙවනු ලැබේ. (හතරවන වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි.) | අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් විෂයයන් 02 කට සම්මාන සහිතව විෂයයන් 06 ක් සමත්ව තිබීම. මින් විෂයයන් 05ක් එක් වරකදී සමත්ව තිබිය යුතුය. |

02. *වෘත්තීය සුදුසුකම්* :

(i) පෞද්ගලික/කුලී රථ සහ තාර බර හොණ්ඩර 24ට අඩු ස්ටේෂන් වැගන් රථ පැදවීම පිළිබඳව මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් විසින් නිකුත් කරන ලද නිපුණතාවය පිළිබඳව සහතිකයක් ලබා තිබීම. (බඳවා ගන්නා දිනට වසර 03කට පෙර අවම වශයෙන් මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් විසින් නිකුත් කරන ලද සී හා සී 1 වාහන පන්තියේ බලපත්‍රයක් හෝ නව රියදුරු බලපත්‍රය අනුව බී පන්තියේ බලපත්‍රයක් ලබා තිබීම.)

(ii) තාර බර හොන්ඩර 34ට වැඩි බර මෝටර් වාහන බර ට්‍රේලර් සහ මගීන් 32ට නොවැඩි සංඛ්‍යාවක් ගෙන යා හැකි බස් රථ සඳහා රියදුරු බලපත්‍රයක් තිබීම. (බඳවා ගන්නා දිනට වසර 03කට පෙර අවම වශයෙන් මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් විසින් නිකුත් කරන ලද ඒ වාහන පන්තියේ බලපත්‍රයක් ලබා තිබීම.)

03. *පළපුරුද්ද* :- මෝටර් රථ පැදවීමේ බලපත්‍රය ලැබීමෙන් පසු අවම වසර 03ක පළපුරුද්ද ලබා තිබීම. (පළපුරුද්ද සහතික මගින් සනාථ කළ යුතුය.)

04. *කායික සුදුසුකම්* :

I. සෑම අපේක්ෂකයෙකුටම මනා ඇස් පෙනීමක් තිබිය යුතු අතර දිවා කාලයේදී සහ රාත්‍රී කාලයේදී සේවයේ යෙදීම පිණිස ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

II. අවම උස අඩි 05 අඟල් 02 1/2 ක් විය යුතුය.

05. *අවශ්‍ය අනෙකුත් සුදුසුකම්* :

(i) අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතුය,

(ii) අයදුම්කරු අයදුම්පත් භාරගන්නා දිනට පූර්වාසන්න වසර 3 ක කාලයක් උකුවෙල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය,

(iii) මහා මාර්ග නීති සංග්‍රහය ගැන මනා දැනුමකින් යුක්ත විය යුතුය,

(iv) බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලු සුදුසුකම් එම සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/ *ගැසට් පත්‍රයේ* සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයෙන්ම සම්පූර්ණ කර තිබිය යුතුය,

(v) අයදුම්පත් භාර ගන්නා දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. (දැනටමත් උකුවෙල ප්‍රාදේශීය සභාවේ සේවයේ යෙදී සිටි ස්ථිර තනතුරු දරන අය සම්බන්ධයෙන් උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.)

(vi) උකුවෙල ප්‍රාදේශීය සභාවේ දැනට තාවකාලික අනියම් ආදේශක කොන්ත්‍රාත් පදනම මත සේවය කරනු ලබන සේවකයන් කෙරේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ,

(vii) අයදුම්කරු යහපත් චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයකින් සිටිය යුතු අතර දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරු වී දඬුවම් ලැබූවෙකු නොවිය යුතුය.

(viii) රජයේ/පළාත් පාලන හෝ සංස්ථා සේවයෙන් පහකරනු ලැබූවෙකු නොවිය යුතු ය.

06. *බඳවා ගැනීමේ ක්‍රමය* :- ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල මත ඉහළම ලකුණු ලැබූ අපේක්ෂකයන්ගෙන් වෘත්තීය පරීක්ෂණයක ප්‍රතිඵල මත අවශ්‍ය සියලුම සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයන්ගෙන් ඉහළම ලකුණු ලැබූවන් අතරින් කුසලතා අනුපිළිවෙල අනුව බඳවා ගනු ලැබේ.

07. *සේවයේ නියුක්ත කරලීමේ කොන්දේසි* :

(i) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය,

(ii) වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත්දරු අරමුදලට දායකත්වය හිමි වේ,

(iii) පත්වීම අවුරුදු 03 ක පරිවාස කාලයකට යටත් වේ,

(iv) මෙම බඳවා ගැනීමේ කොන්දේසි හා රෙගුලාසිවලට අමතරව ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ රෙගුලාසිවලට ද රජයේ දෙපාර්තමේන්තු නියෝගවලටද මධ්‍යම පළාත් සභාව හෝ මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් වරින් වර නිකුත් කරනු ලබන වෙනත් රෙගුලාසි හෝ නියෝගවලට ද අනුකූලව ක්‍රියා කිරීමට සියලුම සේවකයින් බැඳී සිටිය යුතුය.

08. *අයදුම්පත් සමග ඉදිරිපත් කළ යුතු ලිපි ලේඛන* :

(i) ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් සුදුස්සන් තෝරා ගැනේ.

(ii) අයදුම්පත්‍රය සමග පහත සඳහන් සහතිකවල පිටපත් අමුණා එවිය යුතු අතර මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතුය :

*a*) උප්පැන්න සහතිකය,

*b*) අධ්‍යාපන සහතිකය,

*c*) තම පදිංචිය සනාථ කිරීම පිණිස ප්‍රාදේශීය ලේකම්වරයාගේ සහතික,

*d*) මෑතක දී ලබාගත් චරිත සහතික 02 ක් (එක් සහතිකයක් පදිංචි ප්‍රදේශයේ ග්‍රාම නිලධාරිගෙනි),

*e*) මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කළ රියදුරු තනතුර සඳහා අදාළ වන මෝටර් රථ පැදවීමේ බලපත්‍රයක්,

*f*) වෘත්තිය හෝ පළපුරුද්ද පිළිබඳ සහතික : (රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ පළාත් පාලන සේවයේ නියුක්ත වූවන් නම් අයදුම්පත් දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.)

09. මූලික සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීම් කරනු ලැබේ.

10. *අයදුම් කළ යුතු ආකාරය* :-

අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව පිළියෙල කරන ලද අයදුම්පත් ඉල්ලුම් කරන තනතුර කවරයේ වම්පස ඉහළ කෙළවරේ ලියා 2017.11.05 වැනි දින හෝ ඊට ප්‍රථම ලැබෙන සේ "ලේකම්, ප්‍රාදේශීය සභාව, උකුවෙල" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. (දැනටමත් පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත්‍රය ආයතන ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.) නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතරතුර දී මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීමේ පූර්ණ බලය උකුවෙල ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුවේ.

ආර්. ජේ. එන්. ජයසිංහ,
ලේකම්,
උකුවෙල ප්‍රාදේශීය සභාව.

2017 සැප්තැම්බර් මස 25 වැනි දින,
උකුවෙල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

ආදර්ශ අයදුම්පත්‍රය

*උකුවෙල ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩුව පවතින රියදුරු තනතුර සඳහා බඳවා ගැනීම*

01. අයදුම්කරුගේ සම්පූර්ණ නම :————————————.
02. මුලකුරු සමග නම :————————————
03. ස්ථිර ලිපිනය :————————————
04. දුරකතන අංකය ::————————————
05. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :————————————
06. උපන් දිනය :- වර්ෂය :———— මාසය :———— දිනය :————
07. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස :————————————
08. ජාතික හැඳුනුම්පත් අංකය :————————————
09. විවාහක / අවිවාහක බව :————————————
10. ස්ත්‍රී/ පුරුෂ භාවය :————————————
11. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙකු වන්නේ පරම්පරාවෙන් ද? ලියාපදිංචි වීමෙන් ද? යන වග:————————————
12. අධ්‍යාපන සුදුසුකම් (සහතිකවල ඡායා පිටපත් අමුණා එවන්න) ඃ

*අ.පො.ස සාමාන්‍ය පෙළ විභාගය :*

සමත් වර්ෂය : විභාග අංකය :

| *අනු. අංකය* | *විෂයය* | *සාමාර්ථය* | *අනු. අංකය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|---|---|
| 1 | | | 6 | | |
| 2 | | | 7 | | |
| 3 | | | 8 | | |
| 4 | | | 9 | | |
| 5 | | | 10 | | |

*අ.පො.ස උසස් පෙළ* :-

සමත් වර්ෂය : විභාග අංකය :

| *අනු. අංකය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|
| 1 | | |
| 2 | | |
| 3 | | |
| 4 | | |

13. වෙනත් අධ්‍යාපන සුදුසුකම් :
.................................................................................................................................................
.................................................................................................................................................

14. වෘත්තිය සුදුසුකම් :
.................................................................................................................................................
.................................................................................................................................................

i. සේවා පළපුරුද්ද ::——————————.
ii. දැනට සේවය කරන ආයතනය :——————————.
iii. දැනට දරන තනතුර :——————————.
iv. එම තනතුරට පත් වූ දිනය :——————————.
v. මීට පෙර සේවය කරන ලද ස්ථානය හා දරන ලද තනතුර :——————————.

15. ඔබ දැනටමත් මෙම සභාවේ සේවයේ නියුක්තව සිටින්නේ නම් :–

*(a)* දැනට දරන තනතුර :——————————.
*(b)* ස්ථිර/අනියම්/තාවකාලික/කොන්ත්‍රාත් ආදේශක ද යන වග :——————————.
*(c)* එම තනතුරට පත් වූ දිනය :——————————.

16. ඔබ කවරදක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද?

මෙම අයදුම්පතේ මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. ඉහත සඳහන් තොරතුරු අසත්‍ය බවට ඔප්පු වුවහොත් මා සේවයට බඳවා ගැනීමට පෙර නුසුදුස්සෙකු වන බව හා පත්වීම් ලැබීමෙන් පසුව එය ඔප්පු වුවහොත් කිසිදු වන්දියක් ද රහිතව සේවයෙන් පහ කිරීමට යටත් වන බව ද දනිමි.

——————————
අයදුම්කරුගේ අත්සන.

දිනය :——————

*දැනටමත් රාජ්‍ය සේවයේ නියුක්ත වූ අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය*

............................................ මයා/මිය/මෙනෙවිය මෙම ආයතනයේ ...................................................... වශයෙන් සේවයේ නියුක්තව සිටියි. මෙම තනතුර සඳහා තෝරා ගතහොත් ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැක/නොහැක. ඔහු/ඇය කුමන ආකාරයේ හෝ දඬුවමකට භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර ඔහු/ඇය විසින් ඉදිරිපත් කර ඇති අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

——————————
ආයතන ප්‍රධානියාගේ අත්සන.

දිනය :——————

10-658

# පළාත් පාලන නිවේදන

## උඩුනුවර ප්‍රාදේශීය සභාව

සම්මත අතුරු ව්‍යවස්ථා

**1952 අංක 06 දරන පළාත් පාලන ආයතන සම්මත අතුරු ව්‍යවස්ථා පනත**

261 වන අධිකාරිය වන 1952 අංක 06 දරන පළාත් පාලන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව හා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 09(03) උපවගන්තිය ප්‍රකාරව පහත සඳහන් තීරණය මෙයින් නිවේදනය කරනු ලැබේ.

ජී. යූ. ගුණසිංහ,
ලේකම්,
උඩුනුවර ප්‍රාදේශීය සභාව.

2017 සැප්තැම්බර් මස 09 වැනි දින,
උඩුනුවර ප්‍රාදේශීය සභාවේ දී ය.

*තීරණය*

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂාංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියේ (අ) ඡේදය සමග කියවිය යුතු 261 වන අධිකාරිය වන 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ (2) වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මධ්‍යම පළාත් සභාවේ, පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, මධ්‍යම පළාත්, පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2016.02.23 වැනි දින අංක 1955/7 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* iv(අ) වැනි කොටසේ පල කරනු ලැබූ හා මධ්‍යම පළාත් සභාව විසින් අනුමත කොට 2017.05.05 වැනි දින අංක 2017/42 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* iv(අ) වැනි කොටසේ පළකරනු ලැබූ නිවේදනයේ ප්‍රකාශයට පත් කරනු ලද්ද වූ පහත සඳහන් කොට ඇති අතුරු ව්‍යවස්ථා,

01. ප්‍රාදේශීය සභා සීමාව තුළ ගොඩනැගිලි ඉදිකිරීම සඳහා වූ සැළසුම් පරීක්ෂා කිරීම සහ ගාස්තු අයකිරීම පිළිබඳ වූ අතුරු ව්‍යවස්ථාව,
02. සේවා සඳහා ගාස්තු අයකිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව,
03. ත්‍රී රෝද රථ නතර කර තැබීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව,
04. මහජන පුස්තකාල පිළිබඳ අතුරු ව්‍යවස්ථාව,
05. සංචාරක වෙළෙඳාම සම්බන්ධ අතුරු ව්‍යවස්ථාව,
06. බදු අයකර ගැනීමේ කාර්යය සඳහා වාර වාර්තා හා තොරතුරු ලබා ගැනීමේ අතුරු ව්‍යවස්ථාව,
07. පීඩාකාරී ව්‍යාපාර, අන්තරාදයක ව්‍යාපාර හා පීඩාකාරී හා අන්තරාදයක ව්‍යාපාර පිළිබඳ අතුරු ව්‍යවස්ථාව,
08. මාළු විකිණීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව,
09. ප්‍රාදේශීය සභා පොළ පිළිබඳ අතුරු ව්‍යවස්ථාව,
10. සැරසිලි විධිමත් කිරීම හා පාලනය කිරීම සඳහා වන අතුරු ව්‍යවස්ථාව,
11. පොදු වැසිකිළි පාවිච්චිය විධිමත් කිරීම සඳහා වන අතුරු ව්‍යවස්ථාව,
12. ප්‍රචාරක දැන්වීම් පිළිබඳ අතුරු ව්‍යවස්ථාව,
13. සත්ත්ව ගොවිපළවල් පාලනය කිරීම හා විධිමත් කිරීම සඳහා වූ අතුරු ව්‍යවස්ථාව,
14. කුලී රථ වාහන නවතා තැබීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව,
15. මස් විකිණීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව,
16. පෞද්ගලික ඉගෙනුම් ආයතන පිළිබඳ අතුරු ව්‍යවස්ථාව,
17. ගෝ ඝාතකාගාර පිළිබඳ අතුරු ව්‍යවස්ථාව,
18. ප්‍රාදේශීය සභා මංමාවත්වල ධාවනය කරනු ලබන වාහනවල බර හා වේගය පාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව.

මෙම තීරණය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දිනයේ සිට ක්‍රියාත්මක කිරීමටත්, ඊට පෙර දින මධ්‍යම රාත්‍රී 12.00 සිට මීට පෙර ඉහතින් සඳහන් කරන්නට යෙදුන අතුරු ව්‍යවස්ථා සම්බන්ධයෙන් උඩුනුවර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ බලාත්මක වූ සියලුම අතුරු ව්‍යවස්ථා අවලංගු කිරීමටත් හා 1987 අංක 158 දරන ප්‍රාදේශීය සභා පනතේ 09(03) උපවගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2017.09.11 වැනි දින සභාවේ තීරණ අංක 08 යටතේ මෙයින් තීරණය කරමි.

10-509

**මාතර මහා නගර සභාව**

2017 පරිපූරක ඇස්තමේන්තු ලේඛනය

2017 වර්ෂය සඳහා ඇස්තමේන්තු කරන ලද ආදායම් හා වියදම් ඇතුළත් කරන ලද පරිපූරක ඇස්තමේන්තු ලේඛනය මාතර මහා නගර සභා කාර්යාලයේ දී මහජනතාවගේ පරීක්ෂාව සඳහා 2017.10.20 දින සිට දින හතක (07) කාලයක් විවෘතව තබන බව මහා නගර සභා ආඥාපනතේ 214(2) (ආ) වගන්තිය යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

සේනක පල්ලියගුරුගේ,
නාගරික කොමසාරිස්,
මහා නගර සභාව, මාතර.

2017 ඔක්තෝබර් මස 20 වැනි දින,
මාතර මහා නගර සභා කාර්යාලයේ දී ය.

10-659

---

**මහනුවර මහා නගර සභාව**

අයවැය ලේඛනය - 2018

මහා නගර සභා ආඥාපනතේ 212 (ආ) වගන්තිය ප්‍රකාරව 2017 මුදල් වර්ෂය සඳහා වූ අයවැය ලේඛනය 2017 නොවැම්බර් 01 දින සිට දින හතක (07) කාලයක් මහජනයාට පරීක්ෂා කර බැලීම සඳහා මහා නගර සභා ආඥාපනතේ 286 (අ) වගන්තිය යටතේ මහනුවර මහා නගර සභාවේ පරිපාලන කටයුතු කිරීම හා එම කාර්ය හා කර්තව්‍ය ඉටු කිරීම සඳහා බලය පැවරී ඇති නාගරික කොමසාරිස් චන්දන තෙන්නකෝන් වන මා විසින් පහත සඳහන් ස්ථානවල තබා ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ :

1. නාගරික කොමසාරිස් කාර්යාලය, මහනුවර,
2. ප්‍රධාන නාගරික ගණකාධිකාරී කාර්යාලය , මහනුවර,
3. ඩී. එස්. සේනානායක මහජන පුස්තකාලය, මහනුවර.

චන්දන තෙන්නකෝන්,
නාගරික කොමසාරිස්,
මහා නගර සභාව , මහනුවර.

2017 සැප්තැම්බර් මස 28 වැනි දින,
මහනුවර මහා නගර සභා කාර්යාලයේ දී ය.

10-591

---

**මාතර මහා නගර සභාව**

2018 අයවැය ලේඛනය

2018 වර්ෂය සඳහා ඇස්තමේන්තු කරන ලද ආදායම් හා වියදම් ඇතුළත් කෙටුම්පත් අයවැය ලේඛනය මාතර මහා නගර සභා කාර්යාලයේ දී මහජනතාවගේ පරීක්ෂාව සඳහා 2017.10.27 දින සිට දින හතක (07) කාලයක් විවෘතව තබන බව මහා නගර සභා ආඥා පනතේ (252 අධිකාරය) 2012 (ආ) වගන්තිය යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

සේනක පල්ලියගුරුගේ,
නාගරික කොමසාරිස්,
මාතර මහා නගර සභාව.

2017 ඔක්තෝබර් මස 27 වැනි දින,
මාතර මහා නගර සභා කාර්යාලයේ දී ය.

10 - 660

### මාතර මහා නගර සභාව

2018 වර්ෂය සඳහා වරිපනම් බදු පැනවීම

ශ්‍රී ලංකා නීති ප්‍රඥප්ති සංග්‍රහයේ 252 වැනි අධිකාරිය යටතේ මහා නගර සභා ආඥාපනත මගින් පැවරී ඇති බලතල අනුව, මහා නගර සභා ආඥාපනතේ xii වැනි කොටසේ 230 වැනි වගන්තිය යටතේ මහා නගර සභා සීමාව තුළ 2011 වර්ෂයේ කරන ලද නව තක්සේරුව අනුව 2018 වර්ෂයට බලපැවැත්වෙන පරිදි වෙළෙඳ හා වාණිජ කාර්යයන් සඳහා පාවිච්චි කරනු ලබන ස්ථාන සඳහා 12% ක වාර්ෂික වරිපනම් බද්දක් ද, අනෙකුත් දේපළ සඳහා 5% ක වාර්ෂික වරිපනම් බද්දක් ද, 2018 වර්ෂය සඳහා පනවා අය කිරීමට 2017.06.19 දින නාගරික කොමසාරිස්ගේ තීරණ පොතෙහි තීරණ අංක 2177 යටතේ ඒකමතිකව සම්මත කර ඇති බවත්, ඒ අනුව පහත සඳහන් ආකාරයට බදු අය කිරීමට තීරණය කොට ඇති බවත්, මෙයින් දැනුම් දෙනු ලැබේ :

1. පිළිවෙලින් මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30 සහ දෙසැම්බර් මස 31 යන දිනයන්හිදී හෝ ඊට පෙර එම බද්ද සමාන කොටස් හතරකින් ගෙවා නිමකළ හැකිය,
2. 2018 වර්ෂයට නියමිත බදු මුදල එම වර්ෂයේ ජනවාරි 31 වැනි දිනට පෙර සම්පූර්ණයෙන්ම ගෙවා නිම කරන්නේනම් බදු මුදලින් 10% වට්ටමක් ද එක් එක් කාර්තුවට අදාල බදු මුදල් ඒ ඒ කාර්තුවේ මුල් මාසය තුළ ගෙවනු ලබන්නේ නම් සියයට පහක (5%) වට්ටමක් ද ලැබීමට හිමිකම් ලැබේ;
3. ඉහත 1 වන ඡේදයේ සඳහන් දිනවලට පසුව කරනු ලබන ගෙවීම් සම්බන්ධයෙන් ඉඩම් හා වාසස්ථාන, දේපළ වෙනුවෙන් සියයට පහළොවක (15 %) ගාස්තුවක් ද, අනෙකුත් දේපළ වෙනුවෙන් සියයට විස්සක (20%) අමතර ගාස්තුවක් ද, වරෙන්තු ගාස්තු වශයෙන් අයකරනු ලැබේ.

සේනක පල්ලියගුරුගේ,<br>
නාගරික කොමසාරිස් ,<br>
මාතර මහා නගර සභාව.

2017 සැප්තැම්බර් මස 19 වැනි දින,<br>
මාතර මහා නගර සභා කාර්යාලයේ දී ය.

10-661

---

### දෙහිවල-ගල්කිස්ස මහා නගර සභාව

252 වැනි අධිකාරිය වන මහ නගර සභා ආඥාපනතේ 252 වැනි වගන්තිය ප්‍රකාරව දෙහිවල ගල්කිස්ස මහ නගර සභා බල ප්‍රදේශය තුළ පිහිටියා වූද හිඟ වරිපනම් ප්‍රමාණය 2016.12.31 වැනි දිනට රු. 100,000/- ඉක්මවා තිබෙන්නා වූ ද මහ නගර සභා ආඥා පනතේ 252 වගන්තිය ප්‍රකාරව විනිග්‍රහ බලපත්‍රයක් නිකුත් කර තිබෙන්නා වූ දේපළ තහනම් කර විකිණීමෙන් එම හිඟ වරිපනම් හා අය කර ගැනීමේ ගාස්තු (මහ නගර සභා ආඥාපනතේ 255 වගන්තිය ප්‍රකාරව ) අයකර ගැනීම 2017 ඔක්තෝබර් මස 04 වැනි දින සිට ආරම්භ කර ඇති බව මහජනතාවට මෙයින් දැනුම් දෙනු ලැබේ.

නිකුත් කරන ලද බලපත්‍රය අනුව මහ නගර සභා අඥාපනතේ 256 වගන්තිය යටතේ තහනම් කළ යම් දේපළක වටිනාකම රු. 10,000/- ඉක්මවන අවස්ථාවක දී තහනමේ දින සිට දවස් 24ක් ද වෙනත් සියලු අවස්ථාවල දී දවස් 08ක් ද ඉකුත් වූ පසු යම් වෙලාවක දී එම බලපත්‍රය යොමු කරනු ලැබූ බලයලත් නිලධාරියා හෝ කොමසාරිස්වරයා විසින් හිඟ වරිපනම් බදු මුදල ඉහත කාලය තුළ යථා පරිදි ගෙවනු නොලැබ් නම් මිස එකී දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ. තව ද, විකිණීමකින් එකතු කළ මුදල හා අයකර ගැනීමේ ගාස්තු අඩුකර ගැනීමෙන් පසු යම් අතිරික්තයක් තිබේ නම් ඒ අතිරික්තය එසේ විකුණූ දේපළෙහි අයිතිකරුට හෝ සම අයිතිකරුට ආපසු ලබා දෙනු ලැබේ.

ධම්මික මුතුගල,<br>
නාගරික කොමසාරිස්,<br>
දෙහිවල-ගල්කිස්ස මහා නගර සභාව.

10-579

### ගලේවෙල ප්‍රාදේශීය සභාව

ගලේවෙල නගරයේ සෙනසුරාදා සතිපොල භූමියේ නව එළගව
මස් කඩයක් ඉදිකිරීම පිළිබඳ දැනුම්දීම

ගලේවෙල ජයතිලක මාවතේ තොගපොල භූමියේ වෙළඳ සංකීර්ණයේ දැනට පවත්වාගෙන යන ගවමස් කඩයට ප්‍රදේශයේ ජනතාව ගෙන් සහ පැවිදි පක්ෂයෙන් එල්ල වූ දැඩි විරෝධය හේතු කොට ගෙන 2018 වර්ෂයේ ජනවාරි මස සිට මෙම ස්ථානයෙන් ගලේවෙල ගවමස් කඩය ඉවත් කිරීමට තීරණය කර ඇත. ඒ වෙනුවට ගලේවෙල සෙනසුරාදා සතිපොල භූමියේ නව ගවමස් කඩයක් ඉදිකර 2018 වර්ෂයේ ජනවාරි මස සිට වෙළඳ අයිතිය බදු දී මස් පරිභෝජනය කරන ජනතාවට සේවා සැපයීමට සැලසුම් කර ඇත.

මෙම නව ගවමස් කඩය ඉදිකිරීම පිළිබඳව ගලේවෙල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පදිංචි යම් අයෙක් විරුද්ධ වන්නේ නම්, ඔහු හෝ ඇය විසින් තම විරුද්ධත්වයට හේතු දක්වා පිටපත් දෙකකින් යුත් ලියවිල්ලක් මගින්, මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවූ දින සිට දින 14 ක් ඇතුළත දන්වා එවිය යුතු බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

ජී. ඒ. ඩී. ඩබ්. මෙන්ඩිස්,
ලේකම්,
ගලේවෙල ප්‍රාදේශීය සභාව.

2017 ඔක්තෝබර් මස 03 වැනි දින,
ප්‍රාදේශීය සභාව,
ගලේවෙල.

10-596

---

## විවිධ දැන්වීම්

### බණ්ඩාරවෙල මහා නගර සභාව

වෙළඳ බලපත්‍ර ගාස්තු පැනවීම - 2018 වර්ෂය

1947 අංක 29 දරන මහා නගර සභා ආඥාපනතේ (252 වන අධිකාරය) අංක 247 (අ) වැනි වගන්තිය ප්‍රකාරව පැවරී ඇති බලතල අනුව, බණ්ඩාරවෙල මහා නගර සභා බල ප්‍රදේශය තුළ පවත්වාගෙන යනු ලබන පහත උපලේඛනයේ විස්තර වන වෙළඳ ව්‍යාපාර වෙනුවෙන් 2018 වර්ෂයට බලපත්‍ර නිකුත් කිරීම සඳහා ව්‍යාපාර ස්ථානයේ වාර්ෂික වටිනාකම අනුව බලපත්‍ර ගාස්තුවක් පනවා අය කිරීමට බණ්ඩාරවෙල මහා නගර සභා ආඥාපනතේ 286 "අ" වැනි වගන්තිය යටතේ මට පැවරී ඇති බලතල අනුව මෙයින් දැනුම් දෙනු ලැබේ.

02. තව ද මෙකී බලපත්‍ර ගාස්තු 2018 මාර්තු 31 දිනට ප්‍රථම බණ්ඩාරවෙල මහා නගර සභාවට ගෙවා අදාළ ව්‍යාපාරය වෙනුවෙන් බලපත්‍රයක් ලබා ගැනීමට කටයුතු කළයුතු බවද දැනුම් දෙමි.

නීතිඥ එස්. බී. උඩෝවිට,
ශ්‍රී.ලං.ප.සේ. - I
නාගරික කොමසාරිස්,
බණ්ඩාරවෙල මහා නගර සභාව.

2017 ඔක්තෝබර් මස 02 වැනි දින,
බණ්ඩාරවෙල මහා නගර සභා කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| *අනු. අංක* | *වෙළඳ ව්‍යාපාරය* | *වාර්ෂික වටිනාකම රු. 1,500.00 ක් හෝ ඊට අඩු* | *වාර්ෂික වටිනාකම රු. 1,500.00 සිට රු.2,500.00 දක්වා* | *වාර්ෂික වටිනාකම රු. 2,500.00 ට වැඩි* |
|---|---|---|---|---|
| | | *රු.* | *රු.* | *රු.* |
| 1. | පූජා භාණ්ඩ අලෙවි ස්ථානයක් පවත්වාගෙන යාම | 2,000.00 | 3,000.00 | 5,000.00 |
| 2. | වාස්තු හා ජ්‍යෝතිෂ්‍ය විද්‍යා කාර්යාලයක් පවත්වාගෙන යාම | 2,000.00 | 3,000.00 | 5,000.00 |
| 3. | තොග බඩු හෝ සිල්ලර බඩු අලෙවිකරන ස්ථානයක් පවත්වාගෙන යාම | 2,000.00 | 3,000.00 | 5,000.00 |

| *අනු. අංකය* | *වෙළඳ ව්‍යාපාරය* | *වාර්ෂික වටිනාකම රු.1,500.00 ක් හෝ ඊට අඩු* | *වාර්ෂික වටිනාකම රු.1,500.00 සිට රු.2,500.00 දක්වා* | *වාර්ෂික වටිනාකම රු.2,500.00 ට වැඩි* |
|---|---|---|---|---|
| | | *රු.* | *රු.* | *රු.* |
| 4. | නිමි ඇඳුම් හෝ රෙදිපිළි විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 2,000.00 | 3,000.00 | 5,000.00 |
| 5. | සංචාරක හෝටලයක් හෝ ලැගුම්හලක් පවත්වාගෙන යාම | 2,000.00 | 3,000.00 | 5,000.00 |
| 6. | ආපන ශාලාවක් හෝ තේ කඩයක් පවත්වාගෙන යාම | 2,000.00 | 3,000.00 | 5,000.00 |
| 7. | ගොඩනැගිලි ද්‍රව්‍ය අලෙවි ස්ථානයක් පවත්වාගෙන යාම | 2,000.00 | 3,000.00 | 5,000.00 |
| 8. | ගෘහ භාණ්ඩ අලෙවි ස්ථානයක් පවත්වාගෙන යාම | 2,000.00 | 3,000.00 | 5,000.00 |
| 9. | පරිගණක පුහුණු පන්ති පැවැත්වීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 2,000.00 | 3,000.00 | 5,000.00 |
| 10. | ස්වාභාවික මල් අලෙවි ස්ථානයක් පවත්වාගෙන යාම | 2,000.00 | 3,000.00 | 5,000.00 |
| 11. | සන්නිවේදන පහසුකම් සැපයීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 2,000.00 | 3,000.00 | 5,000.00 |
| 12. | ස්ටිකර් කපන ස්ථානයක් පවත්වාගෙන යාම | 2,000.00 | 3,000.00 | 5,000.00 |
| 13. | කොණ්ඩා කැපීමේ හා සැකසීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 2,000.00 | 3,000.00 | 5,000.00 |
| 14. | විදුලි උපකරණ අලෙවි ස්ථානයක් පවත්වාගෙන යාම | 2,000.00 | 3,000.00 | 5,000.00 |
| 15. | පාසල් පොත් හා ලිපි ද්‍රව්‍ය අලෙවි ස්ථානයක් පවත්වාගෙන යාම | 2,000.00 | 3,000.00 | 5,000.00 |
| 16. | වෛද්‍ය රසායනාගාර මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 2,000.00 | 3,000.00 | 5,000.00 |
| 17. | පාවහන් අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 2,000.00 | 3,000.00 | 5,000.00 |
| 18. | පළතුරු බීම අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 2,000.00 | 3,000.00 | 5,000.00 |
| 19. | රත්‍රං බඩු අලෙවි ස්ථානයක් පවත්වාගෙන යාම | 2,000.00 | 3,000.00 | 5,000.00 |
| 20. | සාප්පු බඩු හා විසිතුරු බඩු අලෙවි ස්ථානයක් පවත්වාගෙන යාම | 2,000.00 | 3,000.00 | 5,000.00 |
| 21. | විදේශීය බෙහෙත් අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 2,000.00 | 3,000.00 | 5,000.00 |
| 22. | දේශීය ඖෂධ වෙළඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 2,000.00 | 3,000.00 | 5,000.00 |
| 23. | යතුරු ලියන හා රෝනියෝ යන්ත්‍ර අලුත් වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 2,000.00 | 3,000.00 | 5,000.00 |
| 24. | ඇස් කණ්නාඩි සැපයීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 2,000.00 | 3,000.00 | 5,000.00 |
| 25. | ගෑස් විකුණුම් මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 2,000.00 | 3,000.00 | 5,000.00 |
| 26. | රූපලාවන්‍යාගාරයක් පවත්වාගෙන යාම | 2,000.00 | 3,000.00 | 5,000.00 |
| 27. | බේකරියක් පවත්වාගෙන යාම | 2,000.00 | 3,000.00 | 5,000.00 |
| 28. | ගරාජයක් පවත්වාගෙන යාම | 2,000.00 | 3,000.00 | 5,000.00 |
| 29. | ලොතරැයි අලෙවි ස්ථානයක් පවත්වාගෙන යාම | 2,000.00 | 3,000.00 | 5,000.00 |
| 30. | පළතුරු අලෙවි ස්ථානයක් පවත්වාගෙන යාම | 2,000.00 | 3,000.00 | 5,000.00 |
| 31. | රසකැවිලි අලවෙි සැලක් පවත්වාගෙන යාම | 2,000.00 | 3,000.00 | 5,000.00 |
| 32. | ඔරලෝසු අලුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 2,000.00 | 3,000.00 | 5,000.00 |
| 33. | සීඩී තැටි කුලියට දීම හා අලෙවි ස්ථානයක් පවත්වාගෙන යාම | 2,000.00 | 3,000.00 | 5,000.00 |
| 34. | ජංගම දුරකථන අලෙවිය හා අලුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 2,000.00 | 3,000.00 | 5,000.00 |
| 35. | එළවළු වෙළඳාම (සිල්ලර) කඩයක් පවත්වාගෙන යාම | 2,000.00 | 3,000.00 | 5,000.00 |
| 36. | තොග එළවළු වෙළඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 2,000.00 | 3,000.00 | 5,000.00 |
| 37. | විදුලි උපකරණ අලුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 2,000.00 | 3,000.00 | 5,000.00 |
| 38. | බැටරි චාර්ජ් කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 2,000.00 | 3,000.00 | 5,000.00 |
| 39. | දන්ත ශල්‍යාගාරයක් පවත්වාගෙන යාම | 2,000.00 | 3,000.00 | 5,000.00 |
| 40. | ඡායාරූපාගාරයක් පවත්වාගෙන යාම | 2,000.00 | 3,000.00 | 5,000.00 |
| 41. | පරණ යකඩ බඩු එකතු කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 2,000.00 | 3,000.00 | 5,000.00 |
| 42. | උත්සව භාණ්ඩ සැපයීම හා සැරසිලි කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 2,000.00 | 3,000.00 | 5,000.00 |
| 43. | යතුරුපැදි විකිණීම හා අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 2,000.00 | 3,000.00 | 5,000.00 |
| 44. | දැව අලෙවි සැලක් පවත්වාගෙන යාම | 2,000.00 | 3,000.00 | 5,000.00 |
| 45. | වාහන අමතර කොටස් අලෙවි ස්ථානයක් පවත්වාගෙන යාම | 2,000.00 | 3,000.00 | 5,000.00 |

| අනු. අංක | වෙළඳ ව්‍යාපාරය | වාර්ෂික වටිනාකම රු.1,500.00 ක් හෝ ඊට අඩු | වාර්ෂික වටිනාකම රු.1,500.00 සිට රු.2,500.00 දක්වා | වාර්ෂික වටිනාකම රු. 2,500.00 ට වැඩි |
|---|---|---|---|---|
| | | රු. | රු. | රු. |
| 46. | වාහන සේවා ස්ථානයක් පවත්වාගෙන යාම | 2,000.00 | 3,000.00 | 5,000.00 |
| 47. | ක්‍රීඩා භාණ්ඩ අලෙවි ස්ථානයක් පවත්වාගෙන යාම | 2,000.00 | 3,000.00 | 5,000.00 |
| 48. | පරිගණක විකිණීම හා අලුත්වැඩියා ස්ථානයක් පවත්වාගෙන යාම | 2,000.00 | 3,000.00 | 5,000.00 |
| 49. | සෙරමික් භාණ්ඩ අලෙවි ස්ථානයක් පවත්වාගෙන යාම | 2,000.00 | 3,000.00 | 5,000.00 |
| 50. | සුරතල් මසුන් අලෙවිකරන ස්ථානයක් පවත්වාගෙන යාම | 2,000.00 | 3,000.00 | 5,000.00 |
| 51. | අන්තර්ජාල පහසුකම් සපයන ස්ථානයක් පවත්වාගෙන යාම | 2,000.00 | 3,000.00 | 5,000.00 |
| 52. | මුද්‍රණාලයක් පවත්වාගෙන යාම | 2,000.00 | 3,000.00 | 5,000.00 |
| 53. | ගීත පටිගත කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 2,000.00 | 3,000.00 | 5,000.00 |
| 54. | ආයුර්වේද හා දේශීය වෛද්‍ය මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 2,000.00 | 3,000.00 | 5,000.00 |
| 55. | කෘෂි රසායන ද්‍රව්‍ය අලෙවිසැලක් පවත්වාගෙන යාම | 2,000.00 | 3,000.00 | 5,000.00 |
| 56. | පොල්තෙල් අලෙවි ස්ථානයක් පවත්වාගෙන යාම | 2,000.00 | 3,000.00 | 5,000.00 |
| 57. | කාය වර්ධන මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 2,000.00 | 3,000.00 | 5,000.00 |
| 58. | පරිගණක තීන්ත අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 2,000.00 | 3,000.00 | 5,000.00 |
| 59. | ලිහිසි තෙල් අලෙවි මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 2,000.00 | 3,000.00 | 5,000.00 |
| 60. | පාපැදි විකිණුම් හා අලෙවි මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 2,000.00 | 3,000.00 | 5,000.00 |
| 61. | බුලත් පුවක් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 2,000.00 | 3,000.00 | 5,000.00 |
| 62. | විදුලි උත්පාදක යන්ත්‍ර සැපයීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 2,000.00 | 3,000.00 | 5,000.00 |
| 63. | සිනමා ශාලාවක් පවත්වාගෙන යාම | 2,000.00 | 3,000.00 | 5,000.00 |
| 64. | පාවහන් අලුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 2,000.00 | 3,000.00 | 5,000.00 |
| 65. | තේ කුඩු අලෙවි ස්ථානයක් පවත්වාගෙන යාම | 2,000.00 | 3,000.00 | 5,000.00 |
| 66. | සංගීත උපකරණ කුලියට දීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 2,000.00 | 3,000.00 | 5,000.00 |
| 67. | ගවමස් අලෙවිසැලක් පවත්වාගෙන යාම | 2,000.00 | 3,000.00 | 5,000.00 |
| 68. | එළුමස් අලෙවිසැලක් පවත්වාගෙන යාම | 2,000.00 | 3,000.00 | 5,000.00 |
| 69. | කුකුල් මස් අලෙවි ස්ථානයක් පවත්වාගෙන යාම | 2,000.00 | 3,000.00 | 5,000.00 |
| 70. | මාළු වෙළඳසැලක් පවත්වාගෙන යාම | 2,000.00 | 3,000.00 | 5,000.00 |
| 71. | කුකුල් පොහොර අලෙවි ස්ථානයක් පවත්වාගෙන යාම | 2,000.00 | 3,000.00 | 5,000.00 |
| 72. | ඌරු කොටුවක් පවත්වාගෙන යාම | 2,000.00 | 3,000.00 | 5,000.00 |
| 73. | කුකුල් ගොවිපලක් පවත්වාගෙන යාම | 2,000.00 | 3,000.00 | 5,000.00 |
| 74. | වාහන දුම් පරීක්ෂා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 2,000.00 | 3,000.00 | 5,000.00 |
| 75. | ඇළුමිනියම් ප්ලාස්ටික් අලෙවි ස්ථානයක් පවත්වාගෙන යාම | 2,000.00 | 3,000.00 | 5,000.00 |
| 76. | සත්ව ආහාර අලෙවි ස්ථානයක් පවත්වාගෙන යාම | 2,000.00 | 3,000.00 | 5,000.00 |
| 77. | වීදුරු සහ භාණ්ඩ අලෙවි ස්ථානයක් පවත්වාගෙන යාම | 2,000.00 | 3,000.00 | 5,000.00 |
| 78. | දන්ත කාර්මික මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 2,000.00 | 3,000.00 | 5,000.00 |
| 79. | කුරියර් සර්විස් මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 2,000.00 | 3,000.00 | 5,000.00 |
| 80. | දේශීය භාණ්ඩ අලෙවිසැලක් පවත්වාගෙන යාම | 2,000.00 | 3,000.00 | 5,000.00 |
| 81. | වාහන තීන්ත අලෙවිසැලක් පවත්වාගෙන යාම | 2,000.00 | 3,000.00 | 5,000.00 |
| 82. | පින්තූර රාමු කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 2,000.00 | 3,000.00 | 5,000.00 |
| 83. | අයිස්ක්‍රීම් අලෙවි කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 2,000.00 | 3,000.00 | 5,000.00 |
| 84. | පුවත්පත් අලෙවිකිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 2,000.00 | 3,000.00 | 5,000.00 |
| 85. | තහඩු වැඩ කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 2,000.00 | 3,000.00 | 5,000.00 |
| 86. | කරවල අලෙවිකිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 2,000.00 | 3,000.00 | 5,000.00 |
| 87. | නියෝජිත තැපැල් කාර්යාල පවත්වාගෙන යාම | 2,000.00 | 3,000.00 | 5,000.00 |
| 88. | ටයර් ටියුබ් අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 2,000.00 | 3,000.00 | 5,000.00 |
| 89. | රසායනික පොහොර අලෙවි කිරීමේ හා ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 2,000.00 | 3,000.00 | 5,000.00 |
| 90. | ඉරූ දැව ගබඩාවක් හා අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 2,000.00 | 3,000.00 | 5,000.00 |

| *අනු. අංක* | *වෙළඳ ව්‍යාපාරය* | *වාර්ෂික වටිනාකම රු.1500.00 ක් හෝ ඊට අඩු* *රු.* | *වාර්ෂික වටිනාකම රු.1500.00 සිට රු.2500.00 දක්වා* *රු.* | *වාර්ෂික වටිනාකම රු.1500.00 ට වැඩි* *රු.* |
|---|---|---|---|---|
| 91. | රට බීම හලක් හෝ අවන්හලක් පවත්වාගෙන යාම | 2,000.00 | 3,000.00 | 5,000.00 |
| 92. | නිමි ඇඳුම් කුලියට දීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 2,000.00 | 3,000.00 | 5,000.00 |
| 93. | ඩිජිටල් තාක්ෂණ මුද්‍රණාලයක් පවත්වාගෙන යාම | 2,000.00 | 3,000.00 | 5,000.00 |
| 94. | ගුවන් විදුලි, රූපවාහිනි යන්ත්‍ර අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 2,000.00 | 3,000.00 | 5,000.00 |
| 95. | මෝටර් රථ වාහන අලෙවිකිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 2,000.00 | 3,000.00 | 5,000.00 |
| 96. | මැණික් වෙළඳුන් ලෙස කටයුතු කිරීම | 2,000.00 | 3,000.00 | 5,000.00 |
| 97. | පින්තාරු කිරීමේ ආයතනයක් පවත්වාගෙන යාම | 2,000.00 | 3,000.00 | 5,000.00 |
| 98. | බෙදාහැරීමේ නියෝජිත ආයතනයක් පවත්වාගෙන යාම | 2,000.00 | 3,000.00 | 5,000.00 |
| 99. | ඉන්ධන සැපයුම් ආයතනයක් හෝ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 2,000.00 | 3,000.00 | 5,000.00 |
| 100. | තාවකාලික ජංගම වෙළඳකුටි හෝ වෙනත් ප්‍රචාරක වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | 2,000.00 | 3,000.00 | 5,000.00 |
| 101. | කාර්මික භාණ්ඩ නිෂ්පාදන ආයතනයක් පවත්වාගෙන යාම | 2,000.00 | 3,000.00 | 5,000.00 |
| 102. | බිම්මල් නිෂ්පාදනය හා අලෙවිය | 2,000.00 | 3,000.00 | 5,000.00 |
| 103. | කුළුබඩු පැකට් කර විකිණීම | 2,000.00 | 3,000.00 | 5,000.00 |
| 104. | ධාන්‍ය වර්ග පැකට් කර විකිණීම | 2,000.00 | 3,000.00 | 5,000.00 |
| 105. | හරිතාගාරයක් පවත්වාගෙන යාම | 2,000.00 | 3,000.00 | 5,000.00 |
| 106. | රසායන ද්‍රව්‍ය නිෂ්පාදන ආයතනයක් පවත්වාගෙන යාම | 2,000.00 | 3,000.00 | 5,000.00 |
